2026.06.20 චක්‍රලේඛ අංක **: 52/2026**

දිසා කොමසාරිස්තුමා මගින්
සහය දිසා කොමසාරිස් (සිඟිති) වෙත,

**<u>03 වන ජාතික කිඩෝරිය</u>**

**<u>2026 සැප්තැම්බර් මස 12 සහ 13 යන දිනයන්හී</u>**

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් සංවිධානය කරන 03 වන ජාතික කිඩෝරිය මෙවර **<u>2026 සැප්තැම්බර් මස 12 සහ 13</u>** යන දින වල <u>මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේ දී</u> පැවැත්වීමට කටයුතු සැලසුම් කොට ඇත.

**<u>සිඟිති බාලදක්ෂ සහභාගීත්වය</u>**

1 හා 2 වසර සාමාජිකත්වය ලබා ඇති සියලුම සිඟිති බාලදක්ෂ දරු දැරියන්ට මෙම කිඩෝරියට සහභාගි විය හැකි ය.

**<u>සිඟිති බාලදක්ෂ නායක නායිකා සහභාගීත්වය</u>**

සිඟිති බාලදක්ෂ ගොමුවක් සඳහා බලපත්‍රලාභී සිඟිති බාලදක්ෂ නායිකාවක් සිටීම අනිවාර්යය වේ. සිඟිති නායිකාවන් සීමිතව සිටින පාසල් වල පාසලේ සිටින පෝතක බාලදක්ෂ හෝ බාලදක්ෂ නායිකාවන් සම්බන්ධ කර ගැනීම වඩා සුදුසු ය. එසේත් නොමැති නම් විදුහල්පතිගේ අවසරය මත, දෙමව්පියන් මෙයට සම්බන්ධ කර ගත හැකි අතර ඒ අතරින් සම්බන්ධ වන දෙමාපියන් සඳහා රු.500/- ක ගාස්තුවක් අය කළ යුතු අතර එම දෙමාපිය නාම ලේඛනය පාසල මගින් තම දිසාවල හා ජාතික මූලස්ථානයට දැන්විය යුතු ය.

**<u>ලියාපදිංචිය හා ගෙවීමේ කටයුතු</u>**

සහභාගී වන ළමුන් හා ආචාර්යවරුන් සඳහා රු. 500/- ක මුදලක් පාසල් සංවර්ධන සමිතිය මගින් දිසා බාලදක්ෂ සංගමයට 2026 <u>ජූලි මස 15 වන දිනට</u> පෙර ගෙවිය යුතු ය.

ඉහත මුදලට කිඩෝරි පදක්කම, ක්‍රියාකාරකම් පත්‍රිකාව, කිඩෝරි සහතිකය හා කිඩෝරි බෑගය පිරිනමනු ලැබේ.


ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

දිසා සංගමය මගින් එකතුවන සියලුම මුදල් ජූලි 15 වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයට පහත දැක්වෙන ආකාරයට ගෙවීම කළ යුතු ය. ශ්‍රී ලංකා බාලදකෂ සංගමයේ මහජන බැංකු මූලස්ථාන ශාඛාවේ (**204100150085323**) යන ගිණුම් අංකයට දිසාවේ මුළු මුදල ම තැන්පත් කර එම ලදු පතේ ඔබගේ නම දිස්ත්‍රික්කය සඳහන් කොට 2026 ජූලි 15 දිනට පෙර සිඟිති අංශයේ ලිපිකාරිණී චතුරිකා සෙව්වන්දි මහත්මියගේ **slscout3@yahoo.com** ඊ මේල් ලිපිනයට පමණක් යොමු කරන ලෙස දන්වා සිටිමු.

- පාසල් මට්ටමින් හා දෙමව්පියන් විසින් වරින් වර මුදල් ගෙවීම් කටයුතු සිදු නොකිරීමට සහය දිසා කොමසාරිස් (සිඟිති) වගබලා ගත යුතු බවත් එසේ නොකොට මූලස්ථානයට පැමිණෙන අයගේ ලියා පදිංචි මුදල් භාර නොගන්නා බවත් කාරුණිකව දන්වා සිටිමි. තවද නියමිත දිනට පසුව ලියාපදිංචි නොකරන බව කාරුණිකව දන්වා සිටිමු.

## දිසාව භාර කණ්ඩායම් නායිකා සහය දිසා කොමසාරිස් (සිඟිති)

එක් එක් දිසාව සඳහා සහය දිසා කොමසාරිස් (සිඟිති) ගේ විස්තර, මේ සමග අමුණා ඇති පෝරමය පුරවා මූලස්ථානය වෙත ඉතා ඉක්මනින් යොමු කරන්න. කිඩෝරියට සහභාගීවන සියළුම සිඟිති බාලදක්ෂයින්ගේ, විදුහල්පති හා දෙමාපිය අවසර ලිපි (සපයා ඇති ආකෘති අනුව) ගොණුවක් පවත්වා ගත යුතුයි.

කිඩෝරිය පැවැත්වෙන කාල සීමාව අධ්‍යාපන අමාත්‍යංශය, තුල සෞඛ්‍යය අමාත්‍යංශය හා ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව ඔබ සියලු දෙනා කටයුතු කිරීමට බැදී සිටින බව දන්වමු.

විදුහල්පති අනුමැතිය ඇතිව ආහාර/ජලය, නවාතැන්, ක්‍රියාකාරකම්, සනීපාරක්ෂක කටයුතු පිළිබඳව දෙමාපිය කමිටුවක් පත් කල යුතුයි. ආහාර හා අනෙකුත් වියදම් පිළිබදව සමූහ ආධාරක කමිටුව සමග කටයුතු කළ යුතුයි.

## අයදුම්පත්‍ර සම්බන්ධ දැනුම්වත් කිරීම

- **දිසාවේ තබා ගත යුතු අයදුම්පත්**

- සහය දිසා කොමසාරිස් (සිඟිති) අයදුම්පත්‍රය
- නායිකා අයදුම්පත්‍රය
- සිඟිති බාලදක්ෂ අයදුම්පත්‍රය

යන අයදුම්පත් ඔබගේ දිසාවේ පාසල් මට්ටමින් වෙන් වෙන්ව ගොණුකර තබා ගත යුතු ය.

- **ජාතික බාලදක්ෂ මූලස්ථානයට ලැබිය යුතු අයදුම්පත්**

- කිඩෝරියට සහභාගීවන සිඟිති බාලදක්ෂයින්ගේ නම් සඳහන් පෝරම දිස්ත්‍රික්කයේ පාසල් මට්ටමින් වෙන් වෙන් ව එවිය යුතු ය.
- දිස්ත්‍රික්කයේ සියළුම පාසල් වල සාරාංශගත ලිපි, Letter heads වල විය යුතු ය.

**<u>සෞඛ්‍ය තත්වය</u>**

- සිහිති බාලදක්ෂ ආචාර්යය වරිය දරු දැරියන්ගේ සෞඛ්‍ය තත්ත්වයන් සම්බන්ධයෙන් දැනුම්වත්ව සිටිය යුතු ය. (අසාත්මිකතාවයන් හෝ වෙනත් රෝගී තත්වයන් පිළිබඳව වෛද්‍ය වාර්තා ලබා ගන්න.)
- එවැනි විශේෂ රෝගී තත්වයක් ඇත්නම් දෙමාපියන්ගෙන් ලිඛිත අවසර ලිපියක් ලබා ගත යුතු වේ.
- තම විදුහල අයිති වන සෞඛ්‍ය වෛද්‍යය නිළධාරී කාර්යාලයෙන් මෙම වැඩසටහන සඳහා අවසර ලබා ගත යුතු වේ.

**<u>කිඩෝරි සමරු කලාපය</u>**

03 වන ජාතික කිඩෝරියට නිකුත් කරනු ලබන කිඩෝරි සමරු කලාපය (A5 Size) සඳහා සෑම බාලදක්ෂ දිසාවකින් ම බාලදක්ෂ ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි දැන්වීම් හෝ සිහිති බාලදක්ෂයින්ගේ ඡායාරූප සකස් කර එම දැන්වීම් සමඟ අදාළ මුදල ජූලි මස 30 වන දිනට පෙර ජාතික බාලදක්ෂ මූලස්ථානයට පහත සඳහන් ගිණුම් අංකයට එවීමට කාරුණික වන්න.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ මහජන බැංකු මූලස්ථාන ශාඛාවේ (**204100150085323**) යන ගිණුම් අංකයට මුදල් තැන්පත් කර එම ලදු පතේ ඔබගේ නම දිස්ත්‍රික්කය සඳහන් කොට 2026 ජූනි 30 දිනට හෝ ඊට පෙර සමරුව භාර ලිපිකාරිණී ඩිලන්ති ශ්‍රීමාලි මහත්මියගේ slscout2@yahoo.com ඊ මේල් ලිපිනයට පමණක් යොමු කරන ලෙස දන්වා සිටිමු.

වැඩි විස්තර ඉදිරියේ දී චක්‍ර ලේඛනයක් මගින් දැනුම් දෙනු ලැබේ.

ස්තුතියි,
මෙයට,
බාලදක්ෂ සේවයේ නියුතු,

*චන්ද්‍රාණී ප්‍රනාන්දු*
සහය ප්‍රධාන කොමසාරිස්
(පෝතක හා බාලදක්ෂ බාලිකා)

*නීතීඥ. මනෝජ් නානායක්කාර*
ප්‍රධාන බාලදක්ෂ කොමසාරිස්

**පිටපත් -**
ජාතික මූලස්ථානයේ සියළු ම කොමසාරිස්වරුන් (දැ.ගැ.පි)
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ ගරු සභාපති, ගරු විධායක කමිටු සභාපති, ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික
සිහිති ලිපිගොනුවට